**කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2025**

---

කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර 2019 අගෝස්තු 20 දිනැතිව එළඹි අංක 3806 (SF) දරන ණය ගිවිසුමේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුමට අනුව, ප්‍රවාහන අමාත්‍යාංශය (MOT) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, නඩත්තු ධාරිතාව ශක්තිමත් කිරීම, දුම්රිය ආරක්ෂාව වැඩිදියුණු කිරීම, තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව සහ අනාගත දුම්රිය ව්‍යාපෘති සඳහා සූදානම ශක්තිමත් කිරීම යන නිමවුම්වලින් සමන්විතව දුම්රිය ජාලයේ කාර්යක්ෂමතාව, තිරසාරභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීමය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 31ක් යටතේ ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 134.22 කට සමාන වූ රු. මිලියන 40,186.81ක් වන අතර ඉන් එ.ජ.ඩො. මිලියන 125 කට සමාන රු. මිලියන 37, 426.25 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ එ.ජ.ඩො. මිලියන 9.22 කට සමාන වූ රු. මිලියන 2,760.56 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය මගින් එහි කටයුතු 2019 සැප්තැම්බර් 06 වන දින ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දින වන විට එම කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ දිනය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබූ අතර ව්‍යාපෘතියේ ණය අවසන් කිරීමේ දිනය 2027 ජූනි 30 විය.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2025 දෙසැම්බර් 31 දිනට කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ ඌනතාවය / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ව්‍යාපෘති වියදම්වලට අදාළව පෙර වර්ෂයේ රු. මිලියන 24.85 ක ගැලපීම ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිරිවැය ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 24.85 | මෙය පෙර වසරේ ගැලපීමකි. වෙනසට හේතු වන්නේ මහනුවර තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සහ විස්තරාත්මක සැලසුම සඳහා වැට් බදු ගෙවීම අවලංගු කිරීමයි. මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම නිවැරදි වේ. | නිවැරදි අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පෙර වසරට අදාළව රුපියල් මිලියන 27.88 ක් වූ වියදම සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 27.88 | 2026 වර්ෂයේ සිට ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල වසර අවසානයේ ප්‍රතිපාදන සැලසීමට කටයුතු කර ඇත. | පෙර වසරට අදාළ වියදම් පෙර වසරේ ගනුදෙනුවක් ලෙස ගැලපීමට කටයුතු කළ යුතුය. |

### 2.2 නොසැසඳු ශේෂයන්

| | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූප වාර්තා අනුව වටිනාකම | අනුරූප වාර්තාවේ විස්තරය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | එක්සත් ජනපද ඩොලර් මිලියන 81.07 කි. | එක්සත් ජනපද ඩොලර් මිලියන 83.50 කි. | ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු අරමුදල් සම්බන්ධයෙන් ණය අරමුදල්වල සවිස්තරාත්මක සැසඳීම. | වෙනසට හේතුව ADB LIFS පද්ධතිය තුළ ලබාගත් අත්තිකාරම් වලට එරෙහිව ගිණුම්ගත නොකළ වියදම් වේ. | නිවැරදි අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| **සංරචකය** | **ක්‍රියාකාරකම්** | **2025 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයන්ට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ඒකක/ප්‍රතිශතය** | **ලබා ගත් කාර්යසාධනය ඒකක/ප්‍රතිශතය** | | |
| ව්‍යාපෘතියේ සමස්ත භෞතික කාර්ය සාධනය | ක්‍රියාකාරකම් 31 | සියයට 100 | සියයට 30 සිට සියයට 100 දක්වා | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රධාන කාර්යයන් 31ක් යටතේ රු.32,241,895,116 ක පිරිවැයක් සහිතව සහ 2025 දෙසැම්බර් 31 නියමිත දිනට සැලසුම් කර තිබුණද, රු.2,312,347,053 ක් වටිනා කාර්යයන් 03 ක් මූල්‍යමය හෝ භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි. රු. 9,324,885,477 ක් වටිනා කාර්යයන් 04 ක් සම්පූර්ණ කර නොතිබූ අතර ඒවායේ භෞතික ප්‍රගතිය සියයට 30 සිට සියයට 97 දක්වා පරාසයක පැවති අතර මූල්‍ය ප්‍රගතිය සියයට 0 සිට සියයට 51 දක්වා පරාසයක පැවතුණි. රු. 1,154,868,921 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත කාර්යයන් 04 ක භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලබාගෙන තිබුණද, එම කටයුතුවල මූල්‍ය ප්‍රගතිය සියයට 59 සිට 79 දක්වා පරාසයක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ මූල්‍ය ගාස්තු යටතේ ප්‍රයාපන ගාස්තු වැඩිවීමට හේතු වී තිබුණි. | • අනුමත කිරීමේ ප්‍රමාදයන්.<br><br>• ක්‍රියාත්මක කිරීමේ අභියෝග.<br><br>• අන්තර්කාලීන ඉලක්ක පාදක ගෙවීම් විධිවිධාන.<br><br>• ප්‍රමාද වූ කොන්ත්‍රාත් අත්සන් කිරීම හෝ අඛණ්ඩ ප්‍රසම්පාදන ක්‍රියාවලීන්.<br><br>• කොන්ත්‍රාත්තු සැලකිය යුතු හෝ සම්පූර්ණ භෞතික ප්‍රගතියක් අත්කර ගත්තද, ගිවිසුම් කොන්දේසි, අපේක්ෂිත අන්තර්කාලීන ඉලක්ක හෝ අවසාන ප්‍රතිග්‍රහණ අවශ්‍යතා හේතුවෙන් අනුරූප ගෙවීම් කල් දැමීම. |

| | |
|---|---|
| **කළමනාකරණයේ අදහස් දැක්වීම** | 2025 දී භෞතික හා මූල්‍ය ප්‍රගතිය අතර විෂමතාවයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අනුමත කිරීමේ ප්‍රමාදයන්, ක්‍රියාත්මක කිරීමේ අභියෝග සහ අපේක්ෂිත ඉලක්ක පාදක ගෙවීම් විධිවිධානයන් ය. ප්‍රමාද වූ කොන්ත්‍රාත් අත්සන් කිරීම හෝ අඛණ්ඩ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් හේතුවෙන් සමහර කොන්ත්‍රාත්තුවල මූල්‍ය ප්‍රගතියක් වාර්තා නොවීය. අනෙකුත් කොන්ත්‍රාත්තු සැලකිය යුතු හෝ සම්පූර්ණ භෞතික ප්‍රගතියක් අත්කර ගත් නමුත්, ගිවිසුම් කොන්දේසි, අපේක්ෂිත ඉලක්ක හෝ අවසාන පිළිගැනීමේ අවශ්‍යතා හේතුවෙන් ඊට අදාළ ගෙවීම් කල් දමන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රගතිය වසර තුළ අත්කර ගත් භෞතික ක්‍රියාත්මක කිරීමේ සැබෑ මට්ටම සම්පූර්ණයෙන්ම පිළිබිඹු කර නොතිබුණි. |
| **විගණකගේ නිර්දේශ** | ව්‍යාපෘති කටයුතු හොඳින් සැලසුම් කර, කිසිදු ප්‍රමාදයකින් තොරව ඉලක්කගත දිනට හෝ ඊට පෙර අවසන් කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | **ව්‍යාපෘතියේ විෂය පථය තීරණය කිරීමේ පදනම, ව්‍යාපෘති අරමුණු සහ ප්‍රමුඛතා සැලසුම් අනුව වැඩ කිරීම.**<br><br>ආසියානු සංවර්ධන බැංකුවේ ණය අරමුදල්වලින් 2019 දී වෙන් කරන ලද එ.ජ.ඩො. මිලියන 160, ආර්ථික අර්බුදය හේතුවෙන් 2021 දී එ.ජ.ඩො. මිලියන 125 දක්වා අඩු විය. 2024 දෙසැම්බර් 31 වන දිනට සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ ඉලක්කය සම්පූර්ණ නොවූ බැවින්, ව්‍යාපෘති කාලය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| | (අ) 2024 දෙසැම්බර් 31 වන දිනට අවසන් කිරීමට නියමිතව තිබූ CSREIP හි ක්‍රියාකාරකම්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කිහිපයක මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘති කාලය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති පොලිය එ.ජ.ඩො. මිලියන 7.96 සිට එ.ජ.ඩො. මිලියන 16 දක්වා සියයට 100 කින් වැඩි කර ඇති අතර ප්‍රයාපන ගාස්තු එ.ජ.ඩො. මිලියන 0.74 සිට එ.ජ.ඩො. මිලියන 1.03 දක්වා සියයට 39 කින් වැඩි කර තිබුණි. ඒ අනුව, මුළු මූල්‍ය ගාස්තු | 2024 දෙසැම්බර් 31 වන විට, ව්‍යාපෘතිය ආසන්න වශයෙන් සියයට 80 ක භෞතික ප්‍රගතියක් සහ සියයට 55 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි. එබැවින්, සම්පූර්ණ ව්‍යාපෘතිය මන්දගාමීව ඉදිරියට යන බව නිගමනය කිරීම නිවැරදි නොවේ.<br>ප්‍රධාන ක්‍රියාකාරකම් දෙකක් ප්‍රමාදයන්ට ලක් වූ අතර මෙම ගැටළු හැරුණු විට, මෙම කාලය තුළ කොන්ත්‍රාත් බහුතරයක් සාර්ථකව නිම කරන ලදී. තවද, මෙම තත්වයන් මත පදනම්ව ව්‍යාපෘති දිගුව ලබා දෙන ලද අතර, | ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| එ.ජ.ඩො. මිලියන 8.71 සිට එ.ජ.ඩො. මිලියන 17.03 දක්වා සියයට 96 කින් වැඩි කර තිබුණි. ඒ අනුව 2019 වසරට සාපේක්ෂව මූල්‍ය පිරිවැය සඳහා එ.ජ.ඩො. මිලියන 8.32 ක අමතර පිරිවැයක් උද්ගතවී ඇති අතර, ව්‍යාපෘතියේ මූල්‍ය පිරිවැය මුළු ණය මුදලින් සියයට 7 සිට සියයට 14 දක්වා ඉහළ ගොස්, සංවර්ධන කටයුතු සඳහා ඇති අරමුදල් ව්‍යාපෘති මූල්‍ය පිරිවැය පියවා ගැනීම සඳහා භාවිතා කිරීමට සිදුවී තිබුණි. | ඉතිරි ණය අරමුදල් කොටුව දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම සඳහා යොදා ගැනීමට රජය විසින් තීරණය කරන ලදී. | |
| (ආ) 2019 වසරේ ව්‍යාපෘතිය ආරම්භයේදී, දුම්රිය නඩත්තු ධාරිතාව වැඩි කිරීම, දුම්රිය මෙහෙයුම් සහ මගී ආරක්ෂාව වැඩිදියුණු කිරීම, පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය යන කටයුතු සඳහා එ.ජ.ඩො. මිලියන 30.58 ක් වෙන් කරන ලදී. කෙසේ වෙතත්, එම දිගුකාලීන වාසිදායක ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදනය සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් 2025 දෙසැම්බර් 31 වන දින සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබුණි. කෙටිකාලීන ප්‍රාග්ධන නඩත්තුව සඳහා එ.ජ.ඩො. මිලියන 2.06 ක්, වැඩි වූ මූල්‍ය වියදම් පියවා ගැනීම සඳහා එ.ජ.ඩො. මිලියන 8.32 ක් සහ උපදේශන සේවා සඳහා එ.ජ.ඩො. මිලියන 9.6 ක් වෙන් කර තිබුණි. | ආර්ථික අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ, හදිසි ආධාර සඳහා ණය මුදලින් කොටසක් නැවත වෙන් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය වෙන් කිරීම අඩු කරන ලද අතර, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා නැවත ප්‍රමුඛතා ලබා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, පුහුණු මධ්‍යස්ථාන සංවර්ධන සංරචකයට ප්‍රමුඛතාවය අහිමි වූ අතර, දුම්රිය සේවාව පවත්වාගෙන යාම සඳහා නඩත්තුව තීරණාත්මක සාධකයක් වන බැවින් නඩත්තු කර්මාන්තශාලා සංවර්ධන සංරචකයට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. ඉතිරි අරමුදල් කුඩා පරිමාණ ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලදී. | ව්‍යාපෘතියේ මූලික මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ව්‍යාපෘති නිමවුම් 5 යටතේ 2019 නොවැම්බර් 28 වන දින සිට මාස 18 කින් එ.ජ.ඩො. මිලියන 6.30 ක් භාවිතා කරමින් නිම කිරීමට සැලසුම් කර තිබූ මහනුවර තදාසන්න දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම සඳහා වූ උපදේශන සේවාව, 2025 දෙසැම්බර් 31 වන දින වන විට වසර 5 ක කාලයක් සඳහා රුපියල් 694,352,490 ක් වියදම් කිරීමෙන් පසු උපදේශන සමාගම විසින් 2023 වර්ෂයේදී අත්හිටුවා තිබුණි. උඩරට | උපදේශන කොන්ත්‍රාත්තුව ආරම්භ වූයේ COVID-19 වසංගතය අතරතුර වන අතර එය ජාත්‍යන්තර උපදේශකයන් නියුක්ත කිරීමට සහ ඔවුන්ගේ කාර්යසාධනයට සැලකිය යුතු ලෙස බලපෑවේය. වසංගත කාලය තුළ වැඩ ආරම්භ වුවද, පසුව රජය කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී. ඉන්පසුව, ආර්ථික අර්බුදය උපදේශකයින්ට ඔවුන්ගේ පැවරුම් ඉටු කිරීමේ හැකියාවට තවදුරටත් බලපෑවේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාත්‍යන්තර | අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ නිෂ්ඵල වියදම් අවම කිරීම සඳහා ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම තුළින් මහනුවර නාගරික ප්‍රදේශයේ රථවාහන තදබදයට තිරසාර විසඳුම් ලබා දීමෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනයට දායක වීමේ අරමුණින් ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරන ලද මෙම උප ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර නොගෙන නතර කර තිබූ අතර ඒ සඳහා දරන ලද සෘජු පිරිවැය මෙන්ම ප්‍රමාදයන් හේතුවෙන් ඇති වූ මූල්‍ය පිරිවැය ද මේ වන විට නිශ්කාර්ය ව පැවතුණි. | උපදේශකයින්ට මුල් කොන්ත්‍රාත් කාලය තුළ අවශ්‍ය සැපයුම් සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර, කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමක් අවශ්‍ය විය. වර්තමානයේ, උපදේශක, අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු සියලුම පාර්ශවයන් සාකච්ඡා අවසන් කර ඇති අතර, කොන්ත්‍රාත්තු අතිරේකය අත්සන් කිරීමෙන් පසු උපදේශන සේවා නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. | |
| | (ඇ) 2025 පෙබරවාරි 21 දිනැති ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මෙහෙවර වාර්තාව සහ 2025 ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතට අනුව, ව්‍යාපෘතිය යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා නව උපදේශන සේවා දෙකක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණද, 2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව සංශෝධනය කර නොතිබුණි. | එකඟ වෙමි. සැබෑ අවශ්‍යතා අනුව ඇතැම් උපදේශන පැවරුම් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව, ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ඇතිව තනි උපදේශන අවශ්‍යතා කිහිපයක් අවලංගු කරන ලදී. | මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | **ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඩීසල් විදුලි උත්පාදක යන්ත්‍රයක් (150 kVA සහ ශබ්ද ආරක්ෂණ සහිත) සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදනය.** | | |
| | (අ) මිල ගණන් කැඳවීමේ ක්‍රමය යටතේ 2020 ජූලි මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර මිල ගණන් කැඳවීමට මාස 27 ක්, ලංසු ඇගයීමට මාස 09 ක් සහ ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට මාස 36 ක් ගතවී ඇත. නැවත 2024 පෙබරවාරි 14 වන දින ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය යටතේ ලංසු කැඳවා තිබුණි. ඉන් පසුව ඒවා ඇගයීමට ලක් කර, 2024 ජූලි 09 වන දින රු. 12,791,351 ක මිලකට සාරානුකූල ප්‍රතිචාර දැක්වූ ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදී. ඒ අනුව ලංසු කැඳවීම සඳහා නිසි ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගැනීමට | රත්මලානේ පිහිටි ජර්මානු දුම්රිය තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක කොටසක් ලෙස මෙය 2020 දී ආරම්භ කරන ලදී. ප්‍රතිචාර නොදක්වන ලද දේශීය ලංසු, COVID-19 බාධා සහ 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘති අරමුදල් ප්‍රතිව්‍යුහගත කිරීමට බල කිරීම හේතුවෙන් 150 kVA ඩීසල් විදුලි උත්පාදක යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම විවිධ ප්‍රමාදයන්ට මුහුණ දුන්නේය. පුළුල් ව්‍යාපෘතිය නවතා තිබියදීත්, ADB මාර්ගෝපදේශ යටතේ විදුලි උත්පාදක යන්ත්‍රය ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදනය නියමිත පරිදි සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අපොහොසත් වීම සහ ලංසු ඇගයීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට මාස 48 ක අසාමාන්‍ය කාලයක් ගත කර තිබුණි. | ඉදිරියට ගෙන යන ලද අතර නැවත ලංසු තබන ලදී. පිළිගැනීමේ ලිපිය නිකුත් කිරීමෙන් පසු, කොන්ත්‍රාත්තුව 2026 ජනවාරි 21 වන දින අමාත්‍යාංශය, නීතිපති නිෂ්කාශනය සහ ADB වෙතින් අවසන් අනුමැතිය ඇතුළත් දීර්ඝ සංශෝධන සහ සමාලෝචන ක්‍රියාවලියකට භාජනය වූ අතර, 2026 පෙබරවාරි 11 වන දින ගිවිසුම නිල වශයෙන් අත්සන් කිරීමෙන් අවසන් විය. | |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 8.9.1 (ආ) වගන්තියට අනුව, රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතුය. තවද, මෙම ප්‍රසම්පාදනය සඳහා වන ලංසු ලේඛනවල ඇතුළත් කර ඇති ලංසුකරුවන්ට උපදෙස් වල 42.3 වගන්තියට අනුව, විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම සකස් කර ක්‍රියාත්මක කරන තෙක් කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ දැනුම්දීම බැඳීම් සහිත කොන්ත්‍රාත් ගිවිසුම වන අතර, කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ දැනුම්දීමෙන් පසු ගැනුම්කරු විසින් වහාම සාර්ථක ලංසුකරු වෙත කොන්ත්‍රාත් ගිවිසුම යවා එය අත්සන් කර ලැබුණු දින සිට දින 28ක් ඇතුළත ගැනුම්කරු වෙත යැවිය යුතුය. කෙසේ වෙතත්, 2024 ඔක්තෝබර් 21 දින සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් මාස 13 ක් ගතවී තිබුණද, විගණිත දිනය වන විට එම වගන්තිවලට අනුව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද, කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු ලේඛනවල ඇතුළත් කර ඇති 6 වන වගන්තියේ 2 වන අයිතමයට අනුව අදාළ සැපයුම ලබා දිය යුතු නිශ්චිත දිනය සඳහන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් සහ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව, කොන්ත්‍රාත් ගිවිසුම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා, ඕනෑම සංශෝධන ඇතුළත් කරමින්, කොන්ත්‍රාත් කළමනාකරණ සැලැස්මක් සකස් කර යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම මෙම කාල පරිච්ඡේදයේ ගැටළුව වේ. නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ ADB වෙතින් නිෂ්කාශනය ලබා ගැනීමට මාස කිහිපයක් ගතවී ඇත. මේවනවිට කොන්ත්‍රාත්තුව සම්පූර්ණ වීමට ආසන්නව පවතී. | කොන්ත්‍රාත්තුව ප්‍රදානයකළ පසු වහාම කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ යුතුය. |

(iii) **රත්මලාන දුම්රිය ඩීසල් ඒකකය (DMU) කම්හල සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදනය.**

රත්මලාන දුම්රිය ඩීසල් ඒකකය (DMU) කම්හල සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව විදේශීය කොන්ත්‍රාත්කරුවෙකු සමඟ දින 365ක් ඇතුළත නිම කිරීම සඳහා රු. 2,040,693,262 ක කොන්ත්‍රාත් වටිනාකමකට සමාන එ.ජ.ඩො. 2,776,449.44 ක ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.3.1(ආ) වගන්තියට අනුකූලව, ප්‍රසම්පාදන ආයතනය විසින් ව්‍යාපෘතිය සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග සම්පූර්ණ කර ඇති බව සහතික කළ යුතුය. රත්මලාන වැඩමුළු පරිශ්‍රයේ මෙම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2023 දෙසැම්බර් 27 වන දින කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කරන ලද අතර කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීම සඳහා යෝජිත පරිශ්‍රය එම නියමයන්ට අනුකූලව නිදහස් කළ යුතුය. 2023 දෙසැම්බර් මාසයේ සිට දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරීවරයාට අවස්ථා කිහිපයකදී දැනුම් දී තිබුණේ ප්‍රමාදයන් හේතුවෙන් පැන නගින ඕනෑම ගිවිසුම්ගත බැඳීමක් වළක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට පෙර සිටම යෝජිත ඉදිකිරීම් භූමිය සඳහා පරිශ්‍රය නිදහස් කරන ලෙසයි. නමුත් අයෝග්‍ය පිරිසිදු කිරීම සහ ප්‍රමාදයන් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරුට බාධා ඇතිවී තිබුණි.

භූමිය එළිපෙහෙළි කිරීම සහ කඩා ඉවත් කිරීමේ කටයුතු මුලින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ කොන්ත්‍රාත්කරුගේ වගකීම් අතර බෙදා හරින ලදී. ඇතැම් භූමිය එළිපෙහෙළි කිරීමේ කටයුතු සඳහා දෙපාර්ශවයේම සම්බන්ධීකරණ උත්සාහයන් අවශ්‍ය වන අතර, මෙම කටයුතු කාලෝචිත ලෙස සම්පූර්ණ කිරීමේදී ඇති වූ අභියෝග හේතුවෙන් ප්‍රමාදයන් සිදු විය.

කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය නාගරික සංවර්ධන අධිකාරියෙන් (UDA) අවශ්‍ය අනුමැතීන් සහ නිෂ්කාශන ලබා ගැනීමට කොන්ත්‍රාත්කරු මෙම කාලය යොදා ගත් බැවින්, භූමිය පිරිසිදු කිරීමේ ප්‍රමාදය කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට බලපා නොතිබුණි.

ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා ඉදිකිරීම් භූමිය නිදහස් කළ යුතුය.

(ආ) කර්මාන්ත ශාලාව සඳහා උඩිස් දොඹකර දෙකක් සැපයීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය

එකඟ වෙමි. දීර්ඝ කාලයක් පුරා, කොන්ත්‍රාත්කරු විසින් සැපයුම්කරුවන්ට සහ නිෂ්පාදන

අනුමැතිය ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට

| | | |
|---|---|---|
| ඇතිව විදේශීය නිෂ්පාදකයින් පස් දෙනෙකු නිර්දේශ කර තිබුණි. 2025 ජනවාරි 21 වන දින කොන්ත්‍රාත්කරු විසින් නිෂ්පාදකයාගෙන් මිලදී ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා සිටියද, ඒ සඳහා අනුමැතිය 2025 ජුනි 24 වන දින දක්වා ප්‍රමාද වී ඇති අතර එමගින් දොඹකර සැපයීම සහ ස්ථාපනය කිරීම ප්‍රමාද වී තිබුණි. | රටවලට වෙනස්කම් යෝජනා කරමින් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කරන ලදී.එහි ප්‍රතිඵලයක් ලෙස, ලංසු ලේඛනවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට ඒවා සම්පූර්ණයෙන්ම අනුකූල ද යන්න තහවුරු කර ගැනීම සඳහා යෝජිත දොඹකර පිරිවිතර 2021 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. දෙපාර්තමේන්තුවට එහි සමාලෝචනය සම්පූර්ණ කර එහි අවසාන තීරණය ලබා දීමට ආසන්න වශයෙන් මාස පහක් ගත විය. | කටයුතු කළ යුතුය. |
| (ඇ) ගිවිසුමට අනුව රු.2,040,693,263 ක් වටිනා සම්පූර්ණ වැඩ කටයුතු 2024 දෙසැම්බර් 27 වන දින වන විට අවසන් කළ යුතුව තිබුණි. කොන්ත්‍රාත් කාලය කිහිප වතාවක් දීර්ඝ කරන ලද අතර, ව්‍යාපෘති කළමනාකරණය, දුම්රිය දෙපාර්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු විසින් සිදු කරන ලද ප්‍රමාදයන් හේතුවෙන් වසර 2 ½ ක (මාස 30) දිගුවක් ලබා දෙන ලදී. ඒ අනුව කොන්ත්‍රාත්තුව 2026 ජූලි 27 වන දින අවසන් කළ යුතුය. 2026 පෙබරවාරි වන විට ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 85 ක් වුවද, සැබෑ භෞතික ප්‍රගතිය සියයට 63 ක් පමණක් විය. | රත්මලානේ දුම්රිය DMU වැඩමුළු පරිශ්‍රය ඉදිකිරීමේ කටයුතු කම්කරු හිඟය සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ප්‍රමාදයන්ට ලක් වූ අතර එය ප්‍රධාන ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතියට බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස භෞතික ප්‍රගතිය මන්දගාමී විය. කොන්ත්‍රාත්කරු අතිරේක සම්පත් සහ වේගවත් වැඩ කාලසටහන් ඇතුළත් සංශෝධිත ප්‍රමාද පියවා ගැනීමේ සැලැස්මක් ඉදිරිපත් කළේය. එය ක්‍රියාත්මක කිරීමෙන් පසු, මේ වන විට භෞතික ප්‍රගතියෙන් සියයට 73 ක් අත්කර ගෙන තිබේ. | ඉලක්කගත ව්‍යාපෘති ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | සාමාලොචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් ලෙස ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 11,475 ක් සහ රුපියල් මිලියන 50 ක් වෙන් කර තිබුණද, සත්‍ය වියදම පිළිවෙලින් රුපියල් මිලියන 5,623.26 ක් සහ රුපියල් මිලියන 14.84 ක් වූ අතර, එහි ප්‍රතිඵලයක් | ක්‍රියාකාරී සැලැස්මට සහ වෙන් කළ අයවැයට අනුව දැනටමත් මුදල් ගෙවීමේ කාලසටහන සකස් කර ඇති අතර,ඔබ නිරීක්ෂණය කළ පරිදි, කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය හේතුවෙන් අපගමනය ක් සිදු වී තිබිය හැකිය. | අයවැය ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස අයවැයගත ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 5,851.74 ක් (සියයට 51) ක් සහ රුපියල් මිලියන 35.16 ක් (සියයට 70) ක් ඌන උපයෝජනයක් සිදු වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය විසින් මූල්‍ය හා ආවර්තීක පිරිවැය අවම වන පරිදි ආසියානු සංවර්ධන බැංකුවේ ණය අරමුදල් ප්‍රතිපාදන සහ රජයේ අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා සකස් කර ඇති අයවැය ලේඛනය ඵලදායී පාලන මෙවලමක් ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ii) | ණය ගිවිසුමට අනුව, ණය ගැණුම්කරු විසින් ව්‍යාපෘතියට අදාළ කාර්ය සාධන ගාස්තුව ගෙවිය යුතු අතර එය ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ලබන ණය පහසුකම් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව නොමැතිකම මත පදනම්ව සියයට 0.15 ක ප්‍රතිශතයක් ලෙස ගෙවිය යුතුය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් කරන ලද අයවැයගත ප්‍රයාපන ගාස්තු එ.ජ.ඩො. 70,000 ක් වේ. කෙසේ වෙතත්, සත්‍ය ප්‍රයාපන ගාස්තුව 2025 දෙසැම්බර් 31 වන විට එ.ජ.ඩො. 91,395.82 කට සමාන රු. 27,385,259 ක් වූ අතර අතිරික්ත ප්‍රයාපන ගාස්තු එ.ජ.ඩො. 21,395.82 ට කට සමාන රු 6,416,235 කි. | විගණන නිරීක්ෂණය නිවැරදි ය.සැලසුම් කළ කාලසටහනට අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙය සිදුවී තිබේ. | ප්‍රයාපන ගාස්තු අවම කිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය වේගවත් කිරීමට කටයුතු කළ යුතුය. |